සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

| | | |
|---|---|---|
| කෘෂි තාක්ෂණවේදය I<br>விவசாயத் தொழினுட்பவியல் I<br>Agro Technology I | 18 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.

※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න**.

**1.** මෘදු තාක්ෂණික භාවිතයක් විදහා දැක්වෙන හොඳ ම උදාහරණය තෝරන්න.
(1) සරල ලෝහමය උපකරණයක් නිපදවීම
(2) ශාකමය ඖෂධ නිස්සාරණය කිරීම
(3) ස්වයංක්‍රීයව ධාවනය වන වාහන නිෂ්පාදනය
(4) පුස්තකාල සූචියක් සැලසුම් කිරීම
(5) ලී යොදාගෙන අත්කම් භාණ්ඩයක් කැටයම් කිරීම

**2.** විද්‍යුත් වාණිජ්‍යය (e-commerce) ඉස්මතු වූයේ,
(1) සෙලියුලර් දුරකථන භාවිතයත් සමග ය.
(2) පරිගණක සහ මෘදුකාංගවල දියුණුවත් සමග ය.
(3) වෙළෙඳාමේ ගෝලීයකරණයත් සමග ය.
(4) ණයවර පත් (credit cards) සහ හැරපත් (debit cards) භාවිතයත් සමග ය.
(5) ඉහළ යමින් පවතින පාරිභෝගික අවශ්‍යතා සමග ය.

**3.** ගර්භණීත්වයට පෙර කාන්තාවන්ගේ ශරීරයේ ප්‍රමාණවත් තරම් ෆෝලික් අම්ලය පැවතීමේ ප්‍රධාන සෞඛ්‍යමය වාසිය වනුයේ,
(1) දරුවාගේ අස්ථි සෞඛ්‍යය දියුණුවීමයි.
(2) දරුවාගේ මුල් ළමා අවධියේ අන්ධභාවය වැළැක්වීමයි.
(3) දරුවාගේ මොළයේ සහ සුෂුම්නාවේ උපත් දෝෂ වැළැක්වීමයි.
(4) ගර්භණී සමය තුළ යහපත් හෝමෝන තුලනයක් පවත්වා ගැනීමයි.
(5) ගර්භණී සමය තුළ යහපත් මානසික තුලනයක් පවත්වා ගැනීමයි.

**4.** මනා ආහාර වේලක් සැලසුම් කිරීම සහ සමබල ආහාරයකට අනුගත වීම මගින් බලාපොරොත්තු වන්නේ
A - පෝෂක ඌණතා මගහරවා ගැනීම ය.
B - මන්දපෝෂණය වැළැක්වීම ය.
C - මානසික සෞඛ්‍යය වැඩි දියුණු කිරීම ය.
D - ප්‍රතිශක්තිය ඉහළ නැංවීම ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි.
(3) A, B සහ C පමණි. (4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ල ම.

[දෙවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**5.** යෝගට්, කැවුම්, වයින් සහ පාන්වල ගුණාත්මය ක්ෂය වීම වඩාත් හොඳින් ප්‍රකාශනය වන්නේ පිළිවෙළින්,
(1) දෘඪ බව, ඇඹුල් රස, අනිසි ස්වාදය සහ අනිසි වර්ණය වර්ධනය වීම මගිනි.
(2) අනිසි වර්ණය, මුඩු බව, පැණි රස සහ දෘඪ බව වර්ධනය වීම මගිනි.
(3) ඇඹුල් රස, අනිසි ස්වාදය, ඇඹුල් රස සහ දෘඪ බව වර්ධනය වීම මගිනි.
(4) දුර්ගන්ධය, අනිසි ස්වාදය, ඇඹුල් රස සහ අනිසි වර්ණය වර්ධනය වීම මගිනි.
(5) දුර්ගන්ධය, මුඩු බව, පැණි රස සහ ඇඹුල් රසය වර්ධනය වීම මගිනි.

**6.** පහත සාධක සලකන්න.
A - උෂ්ණත්වය
B - සාපේක්ෂ ආර්ද්‍රතාවය
C - වාතයේ පවතින ඔක්සිජන්
D - පාරජම්බුල කිරණ
ඉහත සාධක අතුරෙන්, දිගු කාලයක් නිරාවරණය වූ විට, පොල්තෙල් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීමට හේතු වන්නේ,
(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A, B සහ C පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ල ම.

**7.** පහත සාධක සලකන්න.
A - කෘෂි යෙදවුම්වල අධික මිල
B - ආහාර සැකසීමට යොදාගන්නා අමුද්‍රව්‍ය දුලබවීම
C - ආහාර ආනයනයට පැන වූ සීමා
D - ආහාර අපනයනය දිරිගැන්වීම
ඉහත සාධක අතුරෙන්, ඉහළ උද්ධමනයක් සහිත රටක ආහාර සුරක්ෂිතතාවයට සෘණාත්මක ලෙස බලපෑ හැක්කේ,
(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A, B සහ C පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ල ම.

**8.** ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ ව සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) මහ කන්නය වියළි වෙමින් පවතින අතර යල කන්නය තෙත් බවින් වැඩිවෙමින් පවතී.
(2) කෘෂි දේශගුණික කලාප හතෙහි වර්ෂාපතන තීව්‍රතාවය වැඩිවෙමින් පවතී.
(3) පසුගිය දශක හය තුළ වසරකට 0.8 °C බැගින් උෂ්ණත්වය වැඩි වී ඇත.
(4) තෙත් කලාපය තවදුරටත් තෙත් වන අතර වියළි කලාපය තවදුරටත් වියළි වෙමින් පවතී.
(5) වියළි කලාපයේ සියලු කෘෂි පාරිසරික කලාප නියඟයට ඇති පාත්‍රීතාවය ඉහළ ය.

**9.** පහත ප්‍රකාශ සලකන්න.
A - රතු දුඹුරු පස ශ්‍රී ලංකාවේ බහුලව ම ව්‍යාප්ත වූ ප්‍රධාන පස් කාණ්ඩයයි.
B - පළමුවන අන්තර් මෝසමේ සහ නිරිතදිග මෝසමේ වෙනස්වීම්, වියළි කලාපයේ ද්වි ශීර්ෂාකාර වර්ෂාපතනයක් ලැබීමට හේතු වී ඇත.
C - ආසියානු රටවල් අතුරෙන් වැඩි ම ශාක/සත්ත්ව විශේෂ ඝනත්වයක් ඇත්තේ ශ්‍රී ලංකාවේ ය.
D - ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කෘෂි පාරිසරික කලාප 15 ක් පවතී.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) B සහ C පමණි.
(4) B සහ D පමණි.
(5) C සහ D පමණි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**10.** පහත ප්‍රකාශ සලකන්න.

A - බීජ ජීව්‍යතාව යනු ප්‍රශස්ත පරිසර තත්ත්ව යටතේ බීජ ප්‍රරෝහණයට ඇති විභවය හෝ හැකියාවයි.
B - ජාන සම්පත් සංරක්ෂණයට බීජ තේරීමේ දී, බීජ ජීව්‍යතාවය වැදගත් සාධකයක් වේ.
C - කලල පරිණත වීම සිදුවන අවධියේ දී, බීජ සුප්තතාවය උත්තේජනය කිරීම සඳහා ශාක හෝමෝනයක් වූ ගිබරලින් අවශ්‍ය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**11.** බීජ ප්‍රරෝහණය පිළිබඳ ව සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සියලු ඒකබීජ පත්‍රී ශාක අපිභෞම ප්‍රරෝහණය පෙන්නුම් කරයි.
(2) ද්විබීජ පත්‍රී ශාක අතුරෙන්, රටකජු අධෝභෞම ප්‍රරෝහණය සඳහා හොඳ උදාහරණයකි.
(3) වීවල බීජාග්‍රපය මගින් ප්‍රාථමික මුල් නිපදවන අතර, ඒවා විගස තන්තු මුල් මගින් ආදේශනය වේ.
(4) බෝංචි බීජ ප්‍රරෝහණයේ දී, බීජෝපරිය පස තුළ දිගටම රැඳී පවතී.
(5) අධෝභෞම ප්‍රරෝහණය සිදුවන ශාක, විශේෂයෙන් ම මූලික වර්ධක අවධිවල දී වේගයෙන් වර්ධනය වේ.

**12.** පහත ප්‍රකාශ සලකන්න.

A - කෙසෙල් කෝම 2% පල්මානික්කම් ද්‍රාවණයක ගිල්වීම, රෝපණ ද්‍රව්‍ය පූර්ව ප්‍රතිකාර කිරීමේ උචිත ක්‍රමයකි.
B - සිටුවීමට පෙර කෙසෙල් කෝම 2% පල්මානික්කම් ද්‍රාවණයක ගිල්වීම, කෙසෙල් ගුල්ලන් පාලනය කිරීමේ ඵලදායි ක්‍රමයක් ලෙස සැලකිය හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ.
(2) B සත්‍ය වන අතර, A අසත්‍ය වේ.
(3) A සහ B දෙකම සත්‍ය වේ.
(4) A සත්‍ය වන අතර, B මගින් එය වඩාත් පැහැදිලි කරනු ලබයි.
(5) B සත්‍ය වන අතර, A මගින් එය වඩාත් පැහැදිලි කරනු ලබයි.

**13.** ඖෂධ ලෙස සියලු කොටස් භාවිත වන ඖෂධීය ශාකයකට උදාහරණයක් වන්නේ,

(1) කොහොඹ ය. (2) වද ය. (3) කහ ය. (4) පාවට්ටා ය. (5) නෙල්ලි ය.

**14.** ශාක වර්ධනය සඳහා සුදුසු සමහර පරිසර තත්ත්ව පහත දී ඇත.

A - සෙවණ
B - ජලය
C - අඳුර

ඉහත පරිසර තත්ත්ව අතුරෙන් බිං කොහොඹ ශාකයේ වර්ධනය සඳහා වඩාත් සුදුසු පරිසර තත්ත්වය/තත්ත්ව වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**15.** වෙක්කයා (*Chanos chanos*) යනු,

(1) මුහුදු මත්ස්‍යයෙකි. (2) මිරිදිය මත්ස්‍යයෙකි.
(3) කිවුල්දිය මත්ස්‍යයෙකි. (4) විසිතුරු මත්ස්‍යයෙකි.
(5) කවච මත්ස්‍යයෙකි.

**16.** පාශ්චරීකරණය උදාහරණයක් වන්නේ,

(1) මස් හා මාලුවල පසු අස්වනු හානි අවම කරනු ලබන ක්‍රමයකට ය.
(2) පලතුරු සහ එළවළු පරිරක්ෂණ ක්‍රමයකට ය.
(3) කිරිවල ක්ෂුද්‍රජීවීන් සම්පූර්ණයෙන් විනාශ කරන ක්‍රමයකට ය.
(4) ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවීන් විනාශ කරන තාප ප්‍රතිකාර ක්‍රමයකට ය.
(5) කිරිවල එන්සයිම අක්‍රිය කිරීම සිදුකරන ක්‍රමයකට ය.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**17.** ජීවානුහරණය මගින් පරිරක්ෂණය කරන ලද සැකසූ ආහාරයක් සඳහා උදාහරණයක් වන්නේ,
(1) සොසේජස් ය. (2) ටින් මාලු ය. (3) චීස් ය. (4) ජෑම් ය. (5) බිස්කට් ය.

**18.** ජාන ඉංජිනේරු විද්‍යාව,
(1) සම්ප්‍රදායික ජෛව තාක්ෂණය සඳහා උදාහරණයකි.
(2) නවීන ජෛව තාක්ෂණය සඳහා උදාහරණයකි.
(3) ඉදිකිරීම් ඉංජිනේරුවන් භාවිත කරනු ලබන තාක්ෂණයකි.
(4) වැඩි දියුණු කළ සත්ත්ව වර්ග බිහි කිරීමට යොදාගැනෙන අත්‍යවශ්‍ය මෙවලමකි.
(5) සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දී බහුල ව භාවිත වේ.

**19.** 'ශදුඅත' (SWOT) විශ්ලේෂණය සාමාන්‍යයෙන් භාවිත කරනුයේ,
(1) ව්‍යාපාරයක ප්‍රගමනය අධ්‍යයනය සඳහා ය.
(2) පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීමේ විභවතාවන් හඳුනාගැනීමට ය.
(3) ව්‍යාපාරයකට ඇති ශක්තීන්, ධනය, අවස්ථා සහ තර්ජන පුරෝකථනය සඳහා ය.
(4) අලුත් ව්‍යාපාර ව්‍යාපෘතියක ඇති ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන හඳුනාගැනීමට ය.
(5) ව්‍යාපාරයක් ස්ථාපිත කළ වහාම එහි තත්ත්වය විග්‍රහ කිරීමට ය.

**20.** සාර්ථක ව්‍යවසායකයකු,
(1) හදිසි අවස්ථාවක දී සියලු ම අදාළ කර්තව්‍යයන් සිදුකිරීම සඳහා හැකියාවක් සහ ආත්ම විශ්වාසයක් ඇති පුද්ගලයෙකු විය යුතු ය.
(2) වැදගත් කර්තව්‍යයන් අන්‍යයන්ට පැවරීමට සූදානමක් ඇති පුද්ගලයෙකු විය යුතු ය.
(3) නම්‍යශීලී සහ සමහරවිට අන්‍යයන් මත යැපෙන පුද්ගලයෙකු විය යුතු ය.
(4) ස්වාධීන ව තීරණ ගැනීමේ හැකියාවක් ඇති පුද්ගලයෙකු විය යුතු ය.
(5) ආයෝජනය සඳහා අවශ්‍ය පමණ මුදල් සතු පුද්ගලයෙකු විය යුතු ය.

**21.** ව්‍යාපාරයක මූල්‍ය වාර්තාවක අඩංගු විය යුත්තේ,
(1) ලාභ ආලාභ, ඉතිරි මුදල සහ ප්‍රාග්ධන ආයෝජනය වේ.
(2) වේතන සඳහා ගෙවීම්, අනෙකුත් පුනරාවර්තන වියදම් සහ ආදායම් වේ.
(3) මුළු වියදම සහ මුළු ආදායම වේ.
(4) මුළු විකුණුම් ආදායම සහ මුළු නිෂ්පාදන වියදම වේ.
(5) මුළු ගෙවීම්, ශුද්ධ ලාභය සහ ඉතිරි මුදල වේ.

**22.** පහත දැක්වෙනුයේ ව්‍යාපාරයක් සම්බන්ධ වගන්ති කිහිපයකි.
A - වෙළෙඳ සැලැස්මක් නිර්මාණය කිරීමට, ඉලක්කගත වෙළෙඳපොළක් තෝරාගැනීම සහ වෙළෙඳ පුරෝකථනයක් අවශ්‍ය වේ.
B - නිෂ්පාදන ක්‍රියාවලියක පුනරාවර්තන වියදම් සඳහා අමුද්‍රව්‍යවල වියදම, සේවක පඩිනඩි සහ යන්ත්‍ර-සූත්‍රවල වියදම් අඩංගු වේ.
C - ස්ථාවර වත්කම් සඳහා සියලු නිශ්චල අයිතමයන්ගේ වටිනාකම් අඩංගු වේ.
ඉහත වගන්ති අතුරෙන් සත්‍ය වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

**23.** පහත ප්‍රකාශ සලකන්න.
A - ජලාශවල අධික ලෙස පොස්පරස් අඩංගුවීම, සුපෝෂණයට හේතු වේ.
B - ගව පාලනයේ දී හරිතාගාර වායූන් විමෝචනය වේ.
C - අපද්‍රව්‍ය නැවත භාවිතයට, වඩා ප්‍රතිචක්‍රීකරණය කිරීම වඩා සුදුසු වේ.
D - ඕසෝන ස්ථරය හායනය කරන ද්‍රව්‍ය අඩංගු ප්‍රධානත ම ප්‍රභවය වනුයේ කෘෂි රසායනිකයන් ය.
ඉහත ප්‍රකාශ අතුරෙන්, පරිසරය දූෂණයට අදාළ ව සත්‍ය ප්‍රකාශ වනුයේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි.
(3) A සහ D පමණි. (4) B සහ C පමණි.
(5) C සහ D පමණි.

[පස්වැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**24.** කොම්පෝස්ට් නිෂ්පාදනයේ දී භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය සඳහා සිදුකරනු ලබන ක්‍රියාකාරකම් කිහිපයක් පහත ලයිස්තුගත කර ඇත.

A - වියළීම

B - කැබලි කිරීම

C - පල් කිරීම

ඉහත ක්‍රියාකාරකම් අතුරෙන්, කොම්පෝස්ට් නිෂ්පාදනය පහසු කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාවලිය/ක්‍රියාවලි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A සහ C පමණි. (5) B සහ C පමණි.

**25.** ජීව වායුවේ අඩංගු ප්‍රධානත ම වායුව වනුයේ,

(1) කාබන් ඩයොක්සයිඩ් ය. (2) කාබන් මොනොක්සයිඩ් ය. (3) මීතේන් ය.

(4) හයිඩ්‍රජන් සල්ෆයිඩ් ය. (5) සල්ෆර් ඩයොක්සයිඩ් ය.

**26.** නවීන ආලෝක උගුලට සමාන පාරම්පරික කෘමි පාලන තාක්ෂණය තෝරන්න.

(1) දිය හොල්මන


(2) කැකුණ තෙල් දණ්ඩ

(3) ක්ෂේත්‍රය ආසන්නයේ ආගමික චාරිත්‍ර පැවැත්වීම

(4) විෂ සහිත ශාක නිෂ්පාදන භාවිතය

(5) ස්වභාවික ඇලෙන සුලු ද්‍රව්‍යයන් ගෑල් වූ ලණුවක් ක්ෂේත්‍රය හරහා ඇදගෙන යාම

**27.** දී ඇති රූපසටහනේ දැක්වෙන උපකරණයේ භාවිතයක් වනුයේ,



(1) මිරිස් වගා ක්ෂේත්‍රයක වැටි සෑදීම ය.

(2) පසේ දෘඪ ස්ථරය බිඳීම ය.

(3) ප්‍රාථමික බිම් සැකසීම ය.

(4) ද්විතීයික බිම් සැකසීම ය.

(5) වාරි ජල සම්පාදනය ය.

**28.** කේන්ද්‍රාපසාරී ජල පොම්ප කෘෂිකර්මයේ දී බහුල ව භාවිත කෙරේ. ඊට හේතුව නම්,

(1) එයට අධික පීඩනයකින් ජලය පොම්ප කිරීමට හැකියාව තිබීමයි.

(2) එය කාර්යක්ෂම, සරල ක්‍රියාකාරිත්වයකින් යුතු මෙන් ම පහසුවෙන් නඩත්තු කළ හැකි වීමයි.

(3) අභ්‍යන්තර දහන එන්ජිමක් මගින් එය ක්‍රියාත්මක කළ හැකි වීමයි.

(4) එය සාමාන්‍යයෙන් විදුලියෙන් ක්‍රියාකිරීමයි.

(5) එය පුරණයෙන් තොරව ක්‍රියාත්මක කළ හැකි වීමයි.

**29.** පාංශු දෘශ්‍ය ඝනත්වය,

(1) පාංශු pH අගය කෙරෙහි සෘජු ව බලපායි.

(2) පසෙහි ජලය රඳවා තබා ගැනීමේ ධාරිතාවේ දර්ශකයකි.

(3) උෂ්ණත්වය සමග වෙනස් වේ.

(4) යම්කිසි පාංශු වර්ගයක් සඳහා නියත අගයකි.

(5) පසේ තෙතමනය අනුව වෙනස් වේ.

**30.** SALT යනු,

(1) කාබනික ද්‍රව්‍ය එකතු කිරීම මගින් පාංශු සාරවත් බව වැඩි කිරීමේ ක්‍රමයකි.

(2) පසෙහි pH අගය වැඩි කිරීමේ ක්‍රමයකි.

(3) බෑවුම් ඉඩම්වල පාංශු සංරක්ෂණ ක්‍රමයකි.


(4) දර පිණිස ශාක වගා කිරීමේ ක්‍රමයකි.

(5) එළවලු වගා ක්ෂේත්‍රයක සුළං බාධක සෑදීමේ ක්‍රමයකි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**31.** දී ඇති රූපසටහනින් පෙන්නුම් කරනුයේ,



(1) ජල පොම්පයක කොටසකි.
(2) බිංදු ජල සම්පාදනයේ දී භාවිත වන බිංදු යොදනයයි.
(3) විසිරුම් හිසකි.
(4) පාදස්ථ කපාටයකි.
(5) ජල සම්පාදන නල සම්බන්ධ කරන කොටසකි.

**32.** වෙනත් ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම සමග සැසඳීමේ දී, බිංදු ජල සම්පාදනය සඳහා වාරි ජලය පෙරීම වඩා වැදගත් වේ. ඊට හේතුව නම්,
(1) අනෙකුත් වාරි ජල සම්පාදන ක්‍රමවලට සාපේක්ෂ ව, බිංදු ජල සම්පාදනයේ දී ජලය ගලා යන වේගය වැඩි නිසා ය.
(2) අනෙකුත් වාරි ජල සම්පාදන ක්‍රමවලට සාපේක්ෂ ව, බිංදු ජල සම්පාදනයේ දී ජල පීඩනය වැඩි නිසා ය.
(3) බිංදු යොදනයේ ජලය පිටවන සිදුරෙහි විෂ්කම්භය කුඩා නිසා ය.
(4) බිංදු ජල සම්පාදන ක්‍රමයේ දී භාවිත කරන ජල නල කුඩා විෂ්කම්භයකින් යුක්ත නිසා ය.
(5) බිංදු ජල සම්පාදනය සඳහා ලවණ ඉවත් කළ ජලය අවශ්‍ය නිසා ය.

**33.** පහත ප්‍රකාශ සලකන්න.

A - ශාක වර්ධනයට හිතකර මූලද්‍රව්‍යයක් ලෙස කොබෝල්ට් සැලකිය හැකි අතර, මෙය සමහර ශාක වර්ගවලට අත්‍යවශ්‍ය විය හැකි ය.
B - සෝයා බෝංචි ශාකයේ රයිසෝබියා වර්ධනයට සහ ඒ සමග සහජීවනයෙන් නයිට්‍රජන් තිර කිරීමට කොබෝල්ට් අත්‍යවශ්‍ය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(2) B සත්‍ය වන අතර A අසත්‍ය වේ.
(3) A සහ B දෙකම සත්‍ය වේ.
(4) A සත්‍ය වන අතර B මගින් එය වඩාත් පැහැදිලි කරනු ලබයි.
(5) B සත්‍ය වන අතර A මගින් එය වඩාත් පැහැදිලි කරනු ලබයි.

**34.** ජෛව පොහොර සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - ජෛව ස්කන්ධවලින් හෝ සුප්ත ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සමන්විත ස්වාභාවික පොහොර, බීජ හෝ පාංශු ආමුකුලන ලෙස යොදාගනී.
B - සියලු ම ජෛව පොහොරවලින් වායුගෝලීය නයිට්‍රජන් පසෙහි සහ රනිල ශාක මූල ගැටිතිවල තිර කරන අතර ඒවා ශාකවලට ලබාගත හැකි ආකාරයට පත් කරයි.
C - මයිකොරයිසා (Mycorrhyza) සහිත ජෛව පොහොර සහ යූරියා, වී වගාවේ මතුපිට යෙදුමක් ලෙස භාවිත කළ හැකි පොහොර මිශ්‍රණයක් විය හැක.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**35.** පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වී යනු C4 ශාකයකි.
(2) බඩඉරිඟු යනු C3 ශාකයකි.
(3) C3 ශාක, C4 ශාකවලට වඩා හොඳින් දේශගුණයට ඔරොත්තු දෙයි.
(4) CAM පරිවෘත්තීය ක්‍රියාවලිය සහිත ශාක ශුෂ්ක තත්ත්වයන්ට වඩාත් හොඳින් අනුවර්තනය වේ.
(5) C3 ප්‍රභාසංශ්ලේෂණය සහිත ශාක C4 යාන්ත්‍රනයක් සහිත ශාකවලට වඩා වැඩි කාර්යක්ෂමතාවයකින් නයිට්‍රජන් භාවිත කරයි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**36.** ශාක පටක රෝපණය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

A - පටක රෝපිත ශාක වෛරස් සහ රෝගවලින් තොරය.
B - ආරම්භක ශාක ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ.
C - වර්ෂය පුරා ම සිදුකළ හැකි ය.
D - යෝග්‍ය ලක්ෂණ සහිත ශාක තෝරාගැනීමේ අවකාශ ලැබේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) C සහ D පමණි.
(4) A, B සහ C පමණි. (5) B, C සහ D පමණි.

**37.** කෘෂි රසායනිකවලට අයත් වන්නේ,

(1) රසායනික පොහොර වේ.
(2) පළිබෝධනාශක වේ.
(3) රසායනික පොහොර සහ පළිබෝධනාශක වේ.
(4) වල්නාශක සහ කෘමිනාශක වේ.
(5) කෘමිනාශක, වල්නාශක සහ දිලීරනාශක වේ.

**38.** බිම් සැකසීමේ දී කුඹුරක ඇති බහුවාර්ෂික වල්පැල වඩාත් හොඳින් පාලනය කළ හැක්කේ,

(1) තෝරා නසන වල්නාශක භාවිත කිරීමෙනි.
(2) සියල්ල නසන වල්නාශක භාවිත කිරීමෙනි.
(3) තෝරා නසන සංස්ථානික වල්නාශක භාවිත කිරීමෙනි.
(4) තෝරා නසන ස්පර්ශක වල්නාශක භාවිත කිරීමෙනි.
(5) සියල්ල නසන සංස්ථානික වල්නාශක භාවිත කිරීමෙනි.

**39.** ජලවහනය දුර්වල පසක වගා කර ඇති ශාකයක තිබිය හැකි ලක්ෂණයක් තෝරන්න.

(1) ඉක්මනින් මල් හට ගැනීම (2) තද පැහැති පත්‍ර තිබීම
(3) ආගන්තුක මුල් හට ගැනීම (4) දිගටි මුල් තිබීම
(5) විශාල පත්‍ර තිබීම

**40.** පහත ප්‍රකාශ සලකන්න.

A - පෝෂක පටල තාක්ෂණයේ දී (NFT) සෙන්ටිමීටර 2-3 ක් ගැඹුරු, සංසරණය වන පෝෂක මාධ්‍යයක් තුළ ශාක වගා කරනු ලැබේ.
B - ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණයේ දී (DFT) සංසරණය වන පෝෂණ මාධ්‍යයක් තුළ ශාක වගා කරනු ලැබේ.
C - නිර්පාංශු, සංසරණය නොවන ද්‍රව මාධ්‍යයක වගා තාක්ෂණයක් සඳහා උදාහරණයක් ලෙස පාවෙන ස්ටයිරෆෝම් ස්ථරයක ශාක වගා කිරීම හැඳින්විය හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ල ම.

**41.** කැපූ මල් නිෂ්පාදනයේ දී 6-Benzykadenine භාවිත කළ හැක්කේ,

(1) ප්‍රතිඔක්සිකාරකයක් ලෙසට ය.
(2) බැක්ටීරියා පාලනය සඳහා වූ විෂබීජ නාශකයක් ලෙසට ය.
(3) මාධ්‍යයේ pH අගය පාලනය කිරීම පිණිස වූ කාරකයක් ලෙසට ය.
(4) අවර්ණ කාරකයක් ලෙසට ය.
(5) කැපූ මල් පතනය ප්‍රමාද කරන කාරකයක් ලෙසට ය.

**42.** පහත ප්‍රකාශ සලකන්න.

A - ගබඩා කාලය දීර්ඝ කර ගැනීම සඳහා කැපූ මල් සහ පත්‍ර, උෂ්ණත්වය 12-16 °C සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය 60-90% යටතේ ගබඩා කළ හැකි ය.
B - උඩවැඩියා මල්වල එක් නටුවක ඇති පිපුණු මල් සංඛ්‍යාව ඒවා ශ්‍රේණිගත කිරීමට බලපායි.
C - කැපූ මල්වල එතිලීන් නිෂ්පාදනය සිල්වර් තයෝසල්ෆේට් මගින් වැඩි කර ගත හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

[අටවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**43.** භූමි අලංකරණයක වැටියක් සඳහා ශාක තෝරා ගැනීමේ දී සැලකිය යුතු වැදගත් ලාක්ෂණික ගුණාංගයක් වන්නේ,
(1) දිග පර්වයක් පැවතීම ය. (2) විශාල පත්‍ර පැවතීම ය.
(3) අකාෂ්ඨීය කඳක් පැවතීම ය. (4) නියං තත්ත්වයට ඔරොත්තු දීම ය.
(5) කප්පාදු කිරීමට ඔරොත්තු දීම ය.

**44.** පහත ප්‍රකාශ සලකන්න.
A - භූමි අලංකරණ සැලසුම්කරණයේ දී විවිධත්වය එක් වැදගත් මූලධර්මයකි.
B - තුලිත බව සහ අවධානය කේන්ද්‍රගත කිරීම භූමි අලංකරණ සැලසුම්කරණයේ දී වැදගත් මූලධර්මයකි.
C - උරුමය සුරැකීම භූමි අලංකරණ සැලසුම්කරණයේ දී සැලකිය යුතු වැදගත් මූලධර්මයකි.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ලම.

**45.** මුල් පොදි බැඳීම සඳහා ශාක තේරීමේ දී සලකා බැලිය යුතු වඩාත් උචිත සාධකය වන්නේ
(1) තන්තු මුල් පද්ධතියක් පැවතීම ය.
(2) ආගන්තුක මුල් පද්ධතියක් පැවතීම ය.
(3) ගැඹුරු මුල් පද්ධතියක් පැවතීම ය.
(4) හොඳින් ස්ථාපනය වූ මුල් පද්ධතියක් පැවතීම ය.
(5) මුදුන් මුල් පද්ධතියක් පැවතීම ය.

**46.** ශක්ති අවශ්‍යතාවය සපුරාලීම පිණිස කුකුළු ආහාර සලාකවල භාවිත කළ හැකි වඩාත් සුදුසු ආහාර වර්ග වන්නේ,
(1) බඩඉරිඟු, මත්ස්‍ය අන්නය සහ සෝයාබෝංචි අන්නය ය.
(2) පොල්තෙල්, සත්ත්ව මේදය සහ සහල් නිවුඩු ය.
(3) බඩඉරිඟු, පොල්තෙල් සහ සුනු සහල් ය.
(4) තිරිඟු, තිරිඟු නිවුඩු සහ සෝගම් ය.
(5) සෝයාබෝංචි අන්නය, මත්ස්‍ය අන්නය සහ පොල් පුන්නක්කු ය.

**47.** කිරි ගවයන් සඳහා වූ ආහාර සලාකයක අඩංගු ප්‍රධාන ආහාර සංඝටකය විය හැක්කේ,
(1) නැවුම් බ්‍රැකේරියා තෘණ ය. (2) බඩඉරිඟු ය.
(3) පොල් පුන්නක්කු ය. (4) පිදුරු ය.
(5) ග්ලිරිසිඩියා කොළ ය.

**48.** රැක්කවීම සඳහා වඩාත් යෝග්‍ය කිකිළි බිත්තර වන්නේ,
(1) ග්‍රෑම් 42 ක් බර සහ සුදු පැහැති කවචයක් සහිත බිත්තර ය.
(2) ග්‍රෑම් 52 ක් බර සහ දුඹුරු පැහැති කවචයක් සහිත බිත්තර ය.
(3) ග්‍රෑම් 50 ක් බර සහ අඳුරු පැල්ලම් සහිත සුදු පැහැති කවචයක් සහිත බිත්තර ය.
(4) ග්‍රෑම් 35 ක් බර සහ දෝෂ රහිත කවචයක් සහිත බිත්තර ය.
(5) ග්‍රෑම් 48 ක් බර රවුම් හැඩැති බිත්තර ය.

**49.** කිරි ගවයෙකුගේ ගර්භණී කාලය සාමාන්‍යයෙන්,
(1) දින 180 කි. (2) දින 200 කි. (3) දින 280 කි. (4) දින 300 කි. (5) දින 365 කි.

**50.** එළකිරි පානය කිරීම වැදගත් වන්නේ,
(1) ප්‍රෝටීන් සහ මේදය ලබා ගැනීමටයි.
(2) ප්‍රෝටීන්, මේදය සහ කාබෝහයිඩ්‍රේට ලබා ගැනීමටයි.
(3) ප්‍රෝටීන්, විටමින් සහ ඛනිජ ලබා ගැනීමටයි.
(4) ප්‍රෝටීන් සහ කැල්සියම් ලබා ගැනීමටයි.
(5) ප්‍රෝටීන්, කැල්සියම් සහ පොස්පරස් ලබා ගැනීමටයි.

***

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

**18 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ......................................

**උපදෙස් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **08** කින් සහ ප්‍රශ්න **10**කින් සමන්විත වේ.

※ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** යනුවෙන් කොටස් **තුනකින්** සමන්විත වන අතර කොටස් **තුනට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස — ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 7)**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

※ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස සහ C කොටස — රචනා (පිටු අංක 8)**

※ එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.

※ සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

※ ප්‍රශ්න පත්‍රයේ **B** හා **C** කොටස් පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |

**එකතුව**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංකය**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

[දෙවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## A - කොටස - ව්‍යුහගත රචනා

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **100** කි.)

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

**1.** (A) පහත සඳහන් මෘදු තාක්ෂණයන්, භාවිතය සඳහා අත්‍යවශ්‍ය වඩාත් උචිත දෘඪ තාක්ෂණයන් සඳහන් කරන්න.

| **මෘදු තාක්ෂණය** | **දෘඪ තාක්ෂණය** |
|---|---|
| (1) බඩු ලැයිස්තු කළමනාකරණය සඳහා මෘදුකාංග භාවිතය | ............................ |
| (2) පාන් නිෂ්පාදනය සඳහා නව වට්ටෝරුවක් (recipe) යොදාගැනීම | ............................ |

(B) 'Word Processing' මෘදුකාංගයක දක්නට **නොලැබෙන** එහෙත් 'Spread Sheet' මෘදුකාංගයේ දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(C) ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාවය සෘජු ව දිරිගන්වන ගෘහ මට්ටමේ ක්‍රියාකාරකම් **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(D) පළිබෝධ නාශක ඉසීමේ දී ආරක්ෂා කළ යුතු පරිසර සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(E) වී වගාවේ දී යහපත් කෘෂිකාර්මික ක්‍රියා පිළිවෙත් (GAP) භාවිතයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(F) කඩොලාන ශාක දක්වන අනුවර්තන **දෙකක්** නම් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(G) ශ්‍රී ලංකාවේ ධාන්‍යවල පසු අස්වනු හානි අවම කිරීමේ ප්‍රධාන ක්‍රම **දෙකක්** ලියන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(H) පහත සඳහන් ව්‍යාපාර සඳහා උදාහරණ **දෙක** බැගින් සඳහන් කරන්න.

(i) නිෂ්පාදන පදනම් කරගත් ජෛව සම්පත් තාක්ෂණික ව්‍යාපාර

(1) ........................................................................................................

(2) ........................................................................................................

(ii) සේවා පදනම් කරගත් කෘෂි තාක්ෂණික ව්‍යාපාර

(1) ........................................................................................................

(2) ........................................................................................................

[තුන්වැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

1161

(I) ව්‍යාපාර අවස්ථාවක් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(J) මහා පරිමාණ යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක වාර්ෂික ගිණුම් සැකසීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන වියදම් සංරචක **තුනක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(K) කෘෂිකර්මාන්තයේ දී තාක්ෂණය අනුචිත අයුරින් භාවිත කිරීම නිසා උත්පාදනය වන ප්‍රධාන වායුගෝලීය දූෂක **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**2.** (A) (i) ආහාරවල බහුල ව හමුවන, පෝෂණීය ව වැදගත් කාබෝහයිඩ්‍රේට ආකාර **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(ii) වයස්ගත පුද්ගලයින් සඳහා අධික මේද සහිත ආහාර නිර්දේශ **නොකිරීමට** හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(B) ආහාරවල පහත සඳහන් දුඹුරු ප්‍රතික්‍රියා සඳහා **එක්** උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

(1) එන්සයිමීය දුඹුරු වීම : ..........................................................

(2) එන්සයිමීය නොවන දුඹුරු වීම : ..........................................................

(C) ඔසු උයන්වල යොදාගැනෙන වර්ධක ව්‍යූහ ආකාර **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................


(2) ..........................................................................................

(D) ශාක ප්‍රචාරණය සඳහා යොදාගත හැකි තාක්ෂණයක් පහත දැක්වේ.

(i) දී ඇති රූපසටහනේ දක්වා ඇති ප්‍රචාරණ තාක්ෂණය නම් කරන්න.

..........................................................................................

(ii) දී ඇති රූපසටහනෙහි A, B සහ C කොටස් හඳුනාගන්න.




A – ..........................................................

B – ..........................................................

C – ..........................................................

[හතරවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(iii) ඉහත ශාක ප්‍රචාරණ තාක්ෂණය යොදාගැනීමේ දී සලකා බැලිය යුතු වැදගත් සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(E) පහත සඳහන් එක් එක් ක්‍රමය යොදාගනිමින් නිපදවනු ලබන ආහාර නිෂ්පාදන සඳහා උදාහරණයක් බැගින් ලියන්න.

| **සැකසුම් ක්‍රමය** | **ආහාර නිෂ්පාදන සඳහා උදාහරණය** |
|---|---|
| (1) පැසවීම | .......................................................... |
| (2) අධිශීතනය | .......................................................... |

(F) පරිණත කොම්පෝස්ට්වල යෝග්‍ය රසායනික ගතිලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(G) (i) ශ්‍රී ලාංකික ජන සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන ප්‍රෝටීන්-ශක්ති ඌනතා ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(ii) ඉහත (i) හි සඳහන් කළ පෝෂණ ගැටලු ඇගයීමේ දී භාවිත වන ප්‍රධාන දර්ශක **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(H) පහත සඳහන් ආහාර නරක්වීම/ගුණාත්මය බාලවීම සඳහා බලපානු ලබන ප්‍රධානතම හේතුව සඳහන් කරන්න.

(1) බෝතල් කරන ලද ජීවානුහරිත කිරිවල මේදය වෙන්වීම

..........................................................................................

..........................................................................................

(2) ගබඩා කාලයේ දී යෝගට්වල ඇඹුල් රසය ඇතිවීම

..........................................................................................

..........................................................................................

(3) ගබඩා කරන ලද අර්තාපල් කොළ පැහැ ගැන්වීම

..........................................................................................

..........................................................................................

Q. 2

100

[පස්වැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

3. (A) ශ්‍රී ලංකාවේ ගොවිතැන සඳහා නව තාක්ෂණය භාවිත කිරීමේ දී සැලකිය යුතු සාධක **දෙකක්** ලියන්න.

(1) ......................................................................................................

(2) ......................................................................................................

(B) අතුරුයත් ගැම සඳහා භාවිත කරන උපකරණ **දෙකක්** නම් කරන්න.

(1) ......................................................................................................

(2) ......................................................................................................

(C) පහත සඳහන් බෝග වගාවන් වඩාත් සුදුසු ජලසම්පාදන ක්‍රමය ලියන්න.


(1) වියළි කලාපයේ අඹ උයනක් ..................................

(2) වියළි කලාපයේ ඇලි සහ වැටි ආශ්‍රිතව සිදුකරන ලද මිරිස් වගාවක් ..................................

(D) රූපසටහනෙහි දී ඇති උපකරණය නම් කර, කෘෂිකර්මාන්තයෙහි දී එහි භාවිතය ලියන්න.

(1) නම : ..........................................

(2) භාවිතය : ..........................................



(E) කෘෂිකර්මාන්තයේ දී පාංශු හායනයේ ඇති අහිතකර බලපෑම් **හතරක්** ලියන්න.

(1) ......................................................................................................

(2) ......................................................................................................

(3) ......................................................................................................

(4) ......................................................................................................

(F) කෘෂිකාර්මික ඉඩම්වලින් සිදුවන ජල හානි අවම කිරීමට යොදාගත හැකි තාක්ෂණයන්/ක්‍රියාකාරකම්/ක්‍රම **හතරක්** ලියන්න.

(1) ......................................................................................................

(2) ......................................................................................................

(3) ......................................................................................................


(4) ......................................................................................................

[ කුයවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(G) පටක රෝපණ තාක්ෂණය පිළිබිඹු වන රූපසටහනක් පහත දැක්වේ.




(a) ඉහත රූපසටහනේ දැක්වෙන පටක රෝපණ තාක්ෂණය නම් කරන්න.

..............................................................................................................

(b) ඉහත රූපසටහනෙහි දක්වා ඇති පටක රෝපණ තාක්ෂණයේ A සිට D දක්වා ඇති පියවර හඳුනා ගන්න.

A – .......................................... B – ..........................................

C – .......................................... D – ..........................................

(H) බෝගවල පෝෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා භාවිත කළ හැකි ප්‍රධාන ක්‍රම **හතරක්** ලයිස්තු ගත කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

Q. 3

100

**4.** (A) ශ්‍රී ලංකාවේ යල කන්නයට වඩා, මහ කන්නයේ දී වී වගාවේ නිෂ්පාදකතාව අඩුවීමට හේතු **දෙකක්** දක්වන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(B) ශ්‍රී ලංකාවේ පටක රෝපණ තාක්ෂණය ජනප්‍රිය කරවීමට ඇති සීමාකාරිකම් **දෙකක්** ලියන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(C) (i) බෝග වගාවේ වල් පැළැටි පාලනය සඳහා සංස්ලේෂිත වල්නාශක (synthetic herbicides) භාවිතයේ වාසි **හතරක්** ලියන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(ii) බෝගවල පළිබෝධ කළමනාකරණය සඳහා යෝග්‍ය ම විකල්පය ලෙස ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය සැලකීමට හේතු **තුනක්** සඳහන් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

(3) ....................................................................................................

(D) ශ්‍රී ලංකාවේ ගොවියන්ට නව තාක්ෂණය හඳුන්වාදීමේ දී සැලකිල්ලට භාජනය කළ යුතු සාධක **දෙකක්** ලියන්න.


(1) ....................................................................................................

(2) ....................................................................................................

(E) දී ඇති, කැපූ මල් සහ පත්‍ර සැලකිල්ලට ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| **කැපූ මල්/ පත්‍ර ආකාරය** | **නෙළීමට සුදුසු පරිණත අවස්ථාව** | **යෝග්‍ය අස්වනු නෙළීමේ තාක්ෂණය/ක්‍රමය** |
|---|---|---|
| ජර්බෙරා | | |
| ඕකිඩ් | | |
| රෝස | | |
| ඩ්‍රසීනා (Dracaena) | | |

(F) ගවයන් සඳහා ප්‍රෝටීන් සාන්ද්‍ර ආහාර වට්ටෝරු සැකසීමේ දී යොදාගන්නා පියර්සන් චතුරස්‍රයක් පහත දැක්වේ. මෙම ආකෘතියෙහි දක්වා ඇති හිස්තැන් පුරවන්න.




............... = ............ %

............... = ............ %

(G) ස්වාභාවික බිත්තර රක්කවීම හා සැසඳීමේ දී කෘත්‍රිම බිත්තර රක්කවීමේ වාසි **දෙකක්** ලියන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

(H) කිරි ගවයන්ගේ කලල මාරු කිරීමේ දී අනුගමනය කළයුතු ප්‍රධාන පියවර **දෙකක්** සඳහන් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

(I) මස් සංරක්ෂණය සඳහා යොදාගන්නා භෞතික ක්‍රම **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

Q.4

100

* *



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

18 S II

## රචනා

* **B** සහ **C** යන කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* එක් ප්‍රශ්නයකට ලකුණු **150** බැගින් හිමි වේ.

## B කොටස

**5.** (i) වල ක්‍රමය භාවිත කරමින් සිදුකෙරෙන කොම්පෝස්ට් නිෂ්පාදනයේ සාර්ථකත්වය තීරණය කරන සාධක විස්තර කරන්න.

(ii) මිනිසාගේ සෞඛ්‍යය සහ පෝෂණය පදනම් කරගනිමින් ආහාර පිරමීඩයක විවිධ ස්ථරයන්හි ආහාර ස්ථානගත කිරීම පැහැදිලි කරන්න.

(iii) ශාකමය ඖෂධ නිෂ්පාදනයේ දී ඖෂධ උයන් නඩත්තු කිරීම වැදගත් අවශ්‍යතාවයකි. ඖෂධ උයන් නඩත්තු කිරීමේ දී සිදුකරන ක්‍රියාකාරකම්වල වැදගත්කම විස්තර කරන්න.

**6.** (i) ව්‍යවසායකයකු නව ව්‍යාපාරයක් ලෙස උද්‍යාන බෝග පැළ තවානක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. එම තවාන ආරම්භ කිරීමට පෙර ඔහු විසින් සලකා බැලිය යුතු විවිධ සාධක විස්තර කරන්න.

(ii) ආහාරවල ගුණාත්මය බාලවීම සහ නරක්වීම සඳහා විවිධ එන්සයිමවල කාර්යභාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(iii) වාණිජ මට්ටමින් ඕකිඩ් ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා භාවිත කළ හැකි ක්‍රමවේදයක් පැහැදිලි කරන්න.

**7.** (i) කෘෂි ආර්ථිකයක් මත පදනම් ව පාලනය වන රටක ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට යොදාගත හැකි බහුවිධ ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ii) මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදනවල පසු අස්වනු හානි අවම කිරීම සඳහා තාක්ෂණයේ භාවිතය පිළිබඳ ව රචනයක් ලියන්න.

(iii) නුසුදුසු ආහාර පුරුදු අනුගමනය කිරීම තුළින් බෝනොවන රෝග ඇතිවීමේ ප්‍රවණතාවය උදාහරණ සහිතව විස්තර කරන්න.

## C කොටස

**8.** (i) ශ්‍රී ලංකාවේ උඩරට, එළවළු වගාවේ දී ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ සංකල්පයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ii) කිකිළි බිත්තර රැක්කවීම සඳහා අවශ්‍ය වන ප්‍රශස්ත පාරිසරික තත්ත්ව පැහැදිලි කරන්න.

(iii) පෞරාණික වාරි ජලාශයක ඇති විවිධ ව්‍යුහ නම් කර, ඒවායේ කාර්යයන් විස්තර කරන්න.

**9.** (i) අපනයන වෙළෙඳපොළ සඳහා කැපූ මල් ලෙස ඇන්තූරියම් පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගත යුතු වැදගත් පසු අස්වනු ක්‍රියාකාරකම් විස්තර කරන්න.

(ii) කෘත්‍රිම සිංචනය සඳහා ගව ශුක්‍රාණු ඇගයීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.

(iii) සුසංහනය වූ පසක් ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාකාරකම් විස්තර කරන්න.

**10.** (i) කිරි ජීවානුහරණය කිරීම සඳහා භාවිත වන ක්‍රම විස්තර කරන්න

(ii) 'වී වගාවේ, තෘණ වල්පැළෑටි සෑම විට ම ගොයම්වලට වඩා තරගකාරී වේ' යන ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ වී වගාවේ භාවිත වන බීජ වප්කර ආකාර **දෙක** විස්තර කරන්න.

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/